# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2423/20 – 2025 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා – 2025.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/198.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ වන නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිලිබඳව -

එච්.එච්.එස්.විජිත ද සිල්වා මයා, නො. 92, ජයසෙන්ගම, මොනරාගල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී


1A – G 043727 – 14 (2025/02)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කඳවල පාර, 55, නීතිඥ බිනර ඒ.ගුණසේකර මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

---

මාගේ අංකය: IR/COM/02/2021/198.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්.එච්.එස්.විජිත ද සිල්වා මයා, නො. 92, ජයසෙන්ගම, මොනරාගල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තණමල්විල ඩිපෝවේ සේවය කළ එච්.එච්.එස්.විජිත ද සිල්වා මහතාගේ සේවය 2018.10.13 දින තහනම් කිරීමෙන් අනතුරුව 2018.11.13 දින නැවත සේවයට වාර්තා කිරීම අනුව,

1. 2018.10.13 දින සිට 2018.11.13 දක්වා කාලසීමාව සඳහා වැටුප
2. 2018 වර්ෂයේ ප්‍රසාද දීමනාව හා
3. විශ්‍රාම යාමට පෙර මාස 3 ක් විශ්‍රාම පූර්ව නිවාඩු (වැටුප් සහිත)

යනාදිය සඳහා හිමිකමක් තිබේ ද හිමිකමක් තිබේ නම් එම හිමිකම් ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
**කම්කරු කොමසාරිස් ජනරාල්.**

2025 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG - 02 - 0116

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.11.18 වන දින අංක 2411/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.11.01 වැනි දින දරන නියෝගයෙන්,

පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2024.10.23 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. එච්. ආනන්ද මයා වෙත යොමු කරන ලදි.

බේරුම්කරු පී. එච්. ආනන්ද මයා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල්, ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.11.01 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

EOG - 02 - 0117/1

මාගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිලිබඳව -

පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව , ජී.එච්.පෙරේරා මාවත, 43/1, නීතිඥ ටී. සී. ජේ. පීරිස් මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

" ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මාතලේ කලුදැවල, ප්‍රාදේශීය වැඩපලේ සේවය කළ පී.ජී. නන්දන කුමාර බණ්ඩාර මහතාට 2008.10.13 දින සිට 2015.03.07 දින දක්වා වැඩ තහනම් කර සිටි කාලසීමාවට අදාළව වැටුප් නොගෙවීම මඟින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
**කම්කරු කොමසාරිස් ජනරාල්.**

2025 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG - 02 - 0117/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.